**සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම -2018/2019**
---------------------------------------------------------------

**සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ ("සමාගම") 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**
-----------------------------------------------------------------------------------------------

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාදන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.**

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**
---------------------------------------------------------

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .**

**2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.**

**2.1 මූල්‍ය ප්‍රකාශන**
--------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් 2018/2019 ගිණුම් වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන විගණිත දිනය වූ 2021 පෙබරවාරි 02 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.** | **අදාළ ගිණුම් ප්‍රකාශන දැනටමත් සකස් කරමින් පවතින හෙයින් සති දෙකක කාලයකින් පසු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.** | **චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය.** |

**2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| විෂය<br>නීති රීති රෙගුලාසි ආදියට යොමුව | විෂය<br>අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| (i) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අග්‍රිමයන් ලබාදීම මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් ඊට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු නිලධාරියෙකුට අවස්ථා 09 කදී එකතුව රු. 472,415 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | විශේෂ අවධානයක් යොමුකර කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛය. | ව්‍යාපාර කටයුතු සඳහා කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිත සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්මක් සකස් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| (i) 7.4.5 වගන්තිය | 2016 වර්ෂයෙන් පසුව සමාගම විසින් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 9.2 හා 9.3.1 ඡේද | සමාගම සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබූ අතර බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | කාර්යක්ෂම සේවාවක් ලබාගැනීමට හැකිවන පරිදි විධිමත් බඳවාගැනීම් පටිපාටියක් සකස් කිරීමටත් ඊට අනුකූලව ඉදිරි බඳවාගැනීම් සිදුකිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) **2018** නොවැම්බර් **14** දිනැති අංක **2/2018** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | චක්‍රලේඛයට පටහැනිව සමාගම සතු රු. **1,463,856** ක් වටිනා ස්ථාවර තැන්පතු පෞද්ගලික වාණිජ බැංකුවක තැන්පත් කර තිබුණි. | දැනටමත් මහජන බැංකුවේ ජංගම ගිණුමක් ආරම්භ කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2015** වර්ෂයේ සිට **2020** නොවැම්බර් **16** දින දක්වා සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත නිකුත් කරන ලද විගණන විමසුම් **26** ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. එසේම එම විගණන විමසුම් මගින් පෙන්වා දී තිබූ අඩුපාඩු හා දුර්වලතා සම්බන්ධයෙන් හෝ ඒවා නිවැරදි කර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමුවී නොතිබුණි. | විශේෂ අවධානය යොමුකර ක්‍රියාකරන ලෙසට උපදෙස් දෙන ලදී. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදිය යුතු අතර ඒ මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කරගත යුතුය. |
| (ආ) | සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම සඳහා ගණකාධිකාරීවරයකු පත්කර ගැනීම වෙනුවෙන් **2013** වර්ෂයේ සිට කටයුතු කර නොතිබූ අතර සහකාර ගණකාධිකාරී තනතුරද **2019** ජුනි **03** දින සිට පුරප්පාඩුව පැවතුණි. මෙම තත්ත්වය අවසන් මූල්‍ය ප්‍රකාශන, විගණනයට කාලීනව ඉදිරිපත් නොවීමටද හේතු වී තිබුණි. | දැනටමත් ගණකාධිකාරීවරයෙකු බඳවාගැනීමට කටයුතු සිදුකරමින් පවතී. | බඳවා ගැනීමේ පරිපාටිය අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **2020** ඔක්තෝබර් **20** දිනට මුද්‍රණ අංශයේ රු. **10,520,015** ක් වූ ණය ගැති ශේෂයෙන් රු. රු. **9,627,122** ක් එනම් මුළු ණය ශේෂයෙන් සියයට **91.5** ක් **2015 - 2019** කාලයට අදාල හිඟහිටි ණය ශේෂ වුවද එම ණය අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සඳහා වෙනම නිළධාරනියක් පත්කර ඇත. | ණයගැති ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඈ) | **2020** ජුනි **30** දිනට පෞද්ගලික බැංකුවක තැන්පත් කර තිබූ වටිනාකම රු. **1,463,856** ක් වූ ස්ථාවර තැන්පතුවලට අදාල තැන්පතු සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ස්ථාවර තැන්පතු සහතිකය සම්බන්ධව බැංකුව සමඟ සාකච්ඡා කර ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙන ලදී. | ස්ථාවර තැන්පතු සහතික විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | නියැදි පරීක්ෂාවන්ට භාජනය වූ අවස්ථා 05කදී නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් සමාගමට සිදුවී ඇති එකතුව රු.1,644,253ක අලාභයට වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී එසේ නොවීමට වගබලා ගන්නා අතර ,මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලෙස උපදෙස් දෙන ලදී. | අලාභයට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු 05න් 03ක් අලාභ ලබමින් පැවති අතර එම තත්ත්වය වලක්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරියට ලාභදායි ලෙස පවත්වාගෙන යාමට අවධානය යොමුකරන ලෙසට උපදෙස් දෙන ලදී. | ව්‍යාපාර කටයුතු ලාභ ලබන තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කළ යුතුය. |

**4.** තිරසර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට සිය සංවිධානයට අයත් සියළුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජයීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම්කර ගනිමින් හඳුන්වාදුන් "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" හි තම විෂය පථය යටතට ගැනෙන තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | දැනටමත් ඒ සම්බන්ධයෙන් අදාල කටයුතු සිදුකරමින් පවතී. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |